# හෙළ සිරි ගම පොදු පහසුකම් වෙනුවෙන් තම හැකියාවන් අපිට බේදා දෙන දොස්තර මහතා

# වෛද්‍ය ගිහාන් සමරසිංහ සමග කතාබහක්



**සන්නස**
ජූනි මස 5 වන දා සවස 6.30 ට ඩැන්ඩිනොන් නෝර්ත් හි Menzies ශාලාවේ දී Lankan Rapsody නමින් ඔබේ සංගීත ප්‍රසංගයක් පැවැත්වෙන බව දැන් අපි දන්නවා. මේ ප්‍රසංගයේ සැකැස්ම ගැන විස්තරයක් කරන්න පුලුවන්ද?

**ගිහාන්**
මේ ප්‍රසංගය පැවැත්වීමේ අරමුණ උඩුනුවර ප්‍රදේශයේ හෙළ සිරි ගම නම් ග්‍රාමයේ පොදු පහසුකම් නැංවීම සඳහා අරමුදලක් පිහිටුවීමටයි. මේ ප්‍රසංගයේදී පණ්ඩිත් අමරදේව, ජෝතිපාල, අමරසිරි පීරිස්, කසුන් කල්හාර, සුනිල්, එඩ්වඩ්, ලතා, ඇන්ජලින්, ක්ලැරන්ස් ඇතුලු ගායක ගායිකාවන් රැසකගේ ගීත ගායනා කිරීමට අප සූදානම්ව සිටිනවා. මෙහි සංගීතය ප්‍රවීණ සංගීත වේදියකු වන දයා සිල්වා ගේ -දයා ඈන් ද ක්ලෑන්" සංගීත කණ්ඩායම විසින් මෙහෙයවනු ලබනවා.

**සන්නස**
මේ ගමම ම මේ කාර්යය සඳහා තෝරා ගැනීමට විශේෂ හේතුවක් තියෙනවද?

**ගිහාන්**
මම 2008 වසරේ උඩුනුවර ප්‍රදේශයේ සෞඛ්‍ය අධ්‍යක්ෂ ධුරය හොබවන කාලයේ ගම්පොල ප්‍රදේශයෙන් ඇරඹුණ දරුණු හෙපටයිටිස් වසංගත මුලින්ම පැතිරුණේ යාබද ව තිබූ හෙළ සිරි ගමටයි. හෙළ සිරි ගමට මේ රෝගය

## මුහුණට මුහුණ

**ශ්‍රීනාත් මද්දුමගේ**

ව්‍යාප්ත වීමට හේතුව පිලිබඳව පර්යේෂණ කරගෙන යන අතර තුරේදී අපට පෙනුණ මූලිකම කරුණ තමයි නිසි ලෙස සකස් වුණ සනීපාරක්ෂක පද්ධතියක් එවුන් සතු නොවීම.

හෙළ සිරි ගමේ සිංහල සහ දෙමළ දිළිඳු පවුල් 83 ක් ජීවත් වෙනවා. ඔවුන් ජලය ලබා ගන්නේ ද ස්වභාවික දොළ පාරවලින්. එම දොළ පාර වලට පුවක් ලීයෙන් තැනූ පීලි භාවිතා කර ජලය ලබා ගත්තත් එයින් ඔවුන්ට ලැබෙන්නෙ අපවිත්‍ර වූ ජලය යි. ඒ ගමේ හෙපටයිටිස් රෝගය ව්‍යාප්ත වෙන්න මූලික කාරණය එයයි. අනෙක් අතින් මේ ගමේ වැසියන්ගේ දුප්පත් කම නිසා නිසි ලෙස සැකසුණ සනීපාර්ක්ෂක පහසුකම් ගොඩ නගා ගන්නවත් ඔවුනට හැකියාවක් නැහැ. එනිසයි අපි හිතුවෙ මේ ගමට නිසි සනීපාරක්ෂක පහසුකම් ලබා දීමේ වැඩ පිලිවෙලක් ආරම්භ කරන්න.

**සන්නස**
ඔබ මේ හැම නිවාසයකටම වෙන වෙනම වැසිකිලි පහසුකම් ලබා දෙනවාද?

**ගිහාන්**
නැහැ. දැනට අපේ අරමුණ එක් පොදු වැසිකිලියක් ලබා දීමත් එහි නඩත්තු කටයුතු නිසි ලෙස කෙරෙන වැඩ පිළිවෙලක් සකස් කිරීමත්. අපට වැඩිපුර ආධාර උපකාර සොයා ගන්නට හැකි වුණොත් සෑම පවුලකටම වෙන වෙනම සනීපාරක්ෂක පහසුකම් සකස් කරදෙන්න අපට පුලුවන්.

ඉතින් මං මේ වෙලාවේ ඉලාලා සිටින්නේ මෙලබන් සිටින ශ්‍රී ලාංකිකයන්ගෙන් මෙම ප්‍රසංගයට සහභාගි වී මෙම ව්‍යාපෘතිය සඳහා ඔබට හැකි උපරිම දායකත්වය ලබා දෙන ලෙසයි.

**සන්නස**
ඔබේ සංගීත දිවයේ ආරම්භය කොහොමද සිදු වුණේ?

**ගිහාන්**
මම මුලින්ම ගීත ගායනා කරන්න පෙළඹුණේ පාසල් කාලයේ දී යි. මා සිප් සතර හැදෑරූ රාජකීය විද්‍යාලයේ කලා උළෙලින් ආරම්භ කළ ගමන තමයි මේ තරම් දුර ආවේ. එහිදී නොයෙකුත් සම්මාන සහතික මට හිමි වුණා. අධ්‍යාපන දක්ෂතා වෙනුවෙන් පිරිනැමෙන රාජු කුමාරස්වාමි අනුස්මරණ ත්‍යාගයද හොඳම ගායකයා වශයෙන් එක් වරක් පමණක් පිරිනමන එස් එච් මාකීන් අනුස්මරණ ත්‍යාගයද මට ලබාගන්නට හැකිවුණා.

**සන්නස**
ඔබ සංගීත හදෑරුවේ කාගෙන්ද?

**ගිහාන්**
මම මුලින්ම සංගීත අත්පොත් තැබුවේ නුවර එම්ජීපී කලායතනයෙන්. එහිදී ආනන්ද පෙරේරා මහතා ඇතුළු දක්ෂයින්යෙග් මට අධ්‍යාපනයක් ලැබුණා. ඒ එක්කම කටහඬ පුහුණුවේ මූලධර්ම විශාරද ෂර්ලි වෛජයන්ත ඇසුරින්ද ඔප මට්ටම් කරගන්න මැට හැකි වුණා. තරුණ සේවා සභාවෙන් පැවැත්වූ දීප ව්‍යාප්ත ස්වර්ණ ගී තරගයෙන් ජයග්‍රාහකයා වුණා. වෛද්‍යවරයෙක් වීමෙන් පසු ලංකාවේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ දක්ෂතම ගායකයා වීමෙන් 2002 හා 2003 වසර වලදී මට සම්මාන ලැබුනා.

**සන්නස**
ඔබගේ මුල්ම සංගීත තැටිය බිහිවුණේ කවදාද?

**ගිහාන්**
මගේ මුල්ම සංගත තැටිය "සිහිනෙන් ගෑ සුවඳක්" නමින් 2008 වසරේ දී ශ්‍රී ලංකවේදී එළි දැක්වුණා. එහිදී එච් එම් ජයවර්ධන, නවරත්න ගමගේ, ආනන්ද පෙරේරා, තරුපති මුණසිංහ මනෝජ් පීරිස් යන අය සංගීතය ලබා දුන්නා. ගීත රචනා කථිකාචාර්ය සමන්ත හේරත් ද මා විසින්ද නිර්මාණය කරනු ලැබුවා.

**සන්නස**
Lankan Rapsody ප්‍රසංගය ඉදිරිපත් කරන්නට ඔබට සහය වන අය කවුද?

**ගිහාන්**
මා ස්තූතිවන්ත වන්නට ඕනේ මා මේ අදහස මුලින්ම කිව් විගස මෙහි මූලික වගකීම කරට ගන්නට කැමති වූ ඔස්ට්‍රේලියන් ඕඩියෝ විෂුවල්ස් ආර්ට් ඇසොසියේෂන් හි සියලුම නිළධාරීන්ට. ඔවුන් තමයි මෙහි මූලික කටයුතු සංවිධානය කරන්නෙ. ඒ එක්කම මෙල්බර්න් නුවර වෙසෙනෙ ප්‍රවීණ ගායක ගායිකාවන් කීප දෙනෙක් මේ ප්‍රසංගයේදී මා සමග එකතු වෙනවා.

*ගිහාන් පළමු ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරියෙකි. ලංකා පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනයේ ප්‍රසව නාරිවේදී හා ප්‍රජනක වෛද්‍ය පිළිබඳ ඩිප්ලෝමාධාරියකු වන ඔහු උඩුනුවර සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ධුරයද දරයි. ඔහුගේ මෙම සත් ක්‍රියාව සඳහා අපට හැකි පමණින් ආධාර කිරීමට අපි පෙළ ගැසෙමු. ජූනි මස 5 වන දා සවස 6.30 ට ඩැන්ඩිනොන් නෝර්ත් හි Menzies ශාලාවේ දී පැවැත්වෙන Lankan Rapsody සංගීත ප්‍රසංගයට අපි සැම සහභාගි වීම අපේ යුතු කමක් යයි සිතමු.*

SUPERIOR
CLEANING SERVICES
DOMESTIC & COMMERCIAL CLEANING
S&D
Specializing in
* Regular Home Cleaning
* Vacating Clean
* Builders Cleaning
* Party Help/Clean Ups
* One Off Clean
* Moving Clean
* Spring Clean
* Pre-Sale Clean
T: 03 9708 6296 M: 0411314417 F: 03 9708 6940
E : sdcleanings@yahoo.com.au

Let us make your kids Smarter!
EDTrack
Education Institute
BROOKSIDE COMMUNITY CENTRE
Federation Way, Caroline Springs
from 1pm on Saturdays
YOUTH CENTRAL
52-59 Pearcedale Parade, Broadmeadows
from 1pm on Sundays
Register at the centre near you.
Ph: 9010 6133 Mob: 0430 079 560
Email: edtrackeducation@gmail.com
Maths , Science English & VCE Subjects
Enrolments open now….
Coaching classes starting for 2nd term 2010
Now @ Genesis Dandenong every Wednesdays and Thursdays( from 4.30pm) and Craigieburn Leisure Canter every Tuesdays and Fridays ( from 4.30pm)



- Classes for primary & secondary school students
- Selective school exams & VCE classes (science, English, chemistry, physics)
- Special classes for learning difficulty students
- Private Home Tutoring for individual students
- Conducted by VIT registered experienced school teachers

popular online education programme free of charge for all primary school students and access 24/7
Guarantee delivers the results within 6 months
www.edtrack.info